සැ. යු.- (i) 2017.10.20 දින පළ වූ අංක 2,042 දරන *ගැසට් පත්‍රයේ* II කොටස පළ නොවීය.

(ii) මෙවර පළවන *ගැසට් පත්‍රයේ* VI කොටසේ 2017 වර්ෂය සඳහා කොළඹ අධිකරණ කලාපයට අයත් ජූරි සභිකයින්ගේ නාමාවලියක් භාෂාත්‍රයෙන් ම පළවේ.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,043 - 2017 ඔක්තෝබර් මස 27 වැනි සිකුරාදා - 2017.10.27**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

## IV (අ) වැනි කොටස - පළාත් සභා

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)

| | පිටුව |
|---|---|
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... ... | — |
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | — |
| වෙනත් පත්කිරීම් ... ... ... ... | — |
| පළාත් සභා නිවේදන ... ... ... ... | — |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — |
| තනතුරු ඇබෑර්තු ... ... ... ... | 1918 |
| විභාග විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | 1927 |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... ... | — |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | — |

*සැ. යු.* - ප්‍රාදේශීය සභා (සංශෝධන) පනත් කෙටුම්පත 2017 ඔක්තෝබර් මස 13 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර (එනම්, 2017 නොවැම්බර් මස 17 වැනි දින පළ කරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2017 නොවැම්බර් මස 02 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති *(වැ. බ.)*

2017 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# තනතුරු - ඇබෑර්තු

## බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර (ශිල්පීය නොවන) ඛණ්ඩ 02 සේවා ගණයේ නේවාසිකාගාර පාලක/පාලිකා III ශ්‍රේණියේ තනතුරට බඳවා ගැනීම

බස්නාහිර පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නේවාසිකාගාර පාලක/පාලිකා III ශ්‍රේණියේ තනතුරු පුරප්පාඩු පිරවීම සඳහා පහත සඳහන් සුදුසුකම්ලත් බස්නාහිර පළාතේ ස්ථිර පදිංචිය ඇති ස්ත්‍රී/පුරුෂ දෙපාර්ශ්වයෙන්ම අයදුම්පත් කැඳවනු ලැබේ.

1. 1.1 *මාසික වැටුප් පරිමාණය* : මම තනතුරට හිමි මාසික වැටුප් පරිමාණය රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 අනුව MN1 - 2016 වන අතර, රු. 27,140 - 10 x 300 - 11 x 350 -10 x 495 - 10 x 660 - රු. 45,540 වේ.
(රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 හි උපලේඛන 11 ප්‍රකාරව වැටුප් ගෙවනු ලැබේ).

1.2 *දීමනා* : රජය විසින් අනුමත ජීවන වියදම් දීමනා වැටුපට අමතරව ගෙවනු ලැබේ.

2. *වයස් සීමාව* : අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය වන 2017.11.17 දිනට වයස අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 35 ට නොවැඩි අයදුම්කරුවන් හට මෙම තනතුර සඳහා ඉල්ලුම් කල හැකිය. පුරප්පාඩු සඳහා බඳවා ගනු ලබන දිනට උපරිම වයස් සීමාව ඉක්මවා නොතිබිය යුතුය. දැනටමත් රාජ්‍ය සේවයේ නියුක්ත වූවන්ට උපරිම වයස් සීමාව බල නොපැවැත්වේ.

3. *අධ්‍යාපන සුදුසුකම්* :

*(අ)* සිංහල හෝ දෙමළ හෝ ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ තවත් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හය (06) කින් අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම.

*සහ*

*(ආ)* අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී අවම වශයෙන් විෂයයන් එක (01) ක් වත් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබීම.

*සහ*

4. *වෘත්තීය සුදුසුකම්* : විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හෝ තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් හෝ අනුමත ආයතනයකින් සමාජ විද්‍යාව / මනෝ විද්‍යාව පිළිබඳව අවම වශයෙන් සහතික පත්‍ර පාඨමාලාවක් හදාරා සහතිකයක් ලබා තිබිය යුතුය.

5. *සේවා කොන්දේසි* :

- මෙම තනතුර ස්ථිරය, විශ්‍රාම වැටුප් සහතිකය (විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණවලට යටත් විය යුතුය.)
- අනුමත බඳවා ගැනීමේ පරිපාටිය අනුව සේවා කොන්දේසි තීරණය වේ.
- තෝරාගනු ලබන අයදුම්කරුවන් වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතුය.

6. *කායික සුදුසුකම්* : සෑම අපේක්ෂකයෙකුම බස්නාහිර පළාත තුළ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට සහ තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික සහ මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

7. *අනෙකුත් සුදුසුකම්* :

*(අ)* අයදුම්කරුවන් ශ්‍රී ලංකාවේ පුරවැසියන් විය යුතුය.
*(ආ)* මනා චරිතයකින් යුක්ත විය යුතුය.
*(ඇ)* 2017.11.17 දිනට පූර්වාසන්න වසර 03 ක කාලය තුල බස්නාහිර පළාත තුල ස්ථිර පදිංචිය තිබිය යුතුය.

8. *බඳවා ගැනීමේ ක්‍රමය.*- සුදුසුකම්ලත් අයදුම්කරුවන් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට භාජනය කිරීමෙන් අනතුරුව බඳවා ගැනීමට කටයුතු කරනු ලැබේ.

9. *අයදුම් කිරීමේ ක්‍රමය.*- මෙම *ගැසට්* නිවේදනය සමග ඇති ආදර්ශ අයදුම් පත්‍රයට අනුව, ඒ 4 ප්‍රමාණයේ (සෙ. මී. 21x23) කඩදසියේ දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් අයදුම්පත සකස් කර ගත යුතුය. සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2017.11.17 දිනට පෙර "ලේකම්, කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග, ධීවර, සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සහ ගොවිජන සංවර්ධන පිළිබඳ අමාත්‍යාංශය (බ.ප.), තැ.පෙ. 566, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත, කොළඹ 07." යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහා එවන ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ "**බස්නාහිර පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නේවාසිකාගාර පාලක/පාලිකා III ශ්‍රේණියේ තනතුරු පුරප්පාඩු සඳහා බඳවා ගැනීම - 2017**" යනුවෙන් සඳහන් කළ යුතුය. (දැනටමත් රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර සේවයේ නියුතු අයදුම්කරුවන් තම අයදුම්පත් සේවා ප්‍රධානියා මගින් එවිය යුතුය). ප්‍රමාදවී ලැබෙන අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් ලැබුණු බව දන්වනු නොලැබේ.

මෙම නිවේදනයට අනුව අයදුම්කරුවන්ගේ සුදුසුකම් පරීක්ෂා කරන අවස්ථාවකදී ඔවුන් විසින් අවශ්‍ය සුදුසුකම් සපුරා නොමැති බව අනාවරණය වුවහොත් එම අය හට පත්වීම ලැබීමට ඇති හිමිකම අවලංගු කරනු ලැබේ. මෙම අයදුම්පත් කැඳවීමේ *ගැසට්* නිවේදනයේ ඇතුළත් කරුණු හෝ එම නිවේදනයෙන් ආවරණය නොවන වෙනත් කරුණක් වෙතොත් ඒ පිළිබඳව බස්නාහිර පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශ ලේකම්ගේ තීරණය අවසාන තීරණය වන්නේය.

එන්. නිල්වල,
ලේකම්,
කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග, ධීවර,
සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සහ ගොවිජන
සංවර්ධන පිළිබඳ අමාත්‍යාංශය (බ.ප.).

තැ. පෙ. 566,
ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත,
කොළඹ 07.

ආදර්ශ අයදුම්පත

***බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර (ශිල්පීය නොවන) ඛණ්ඩ 02 සේවා ගණයේ නේවාසිකාගාර පාලක/පාලිකා III ශ්‍රේණියේ තනතුරට බඳවා ගැනීම***

01. I. මුලකුරු සමග නම :..............................................................................................................

II. මුලකුරු වලින් හැඳින්වෙන නම් :..............................................................................................

..............................................................................................................................................

02. I. ස්ථිර ලිපිනය :......................................................................................................................

II. රාජකාරි ලිපිනය :...................................................................................................................

III. දුරකථන අංකය : පෞද්ගලික :.................................................. රජකාරි :..............................................

03. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :............................................................................

04. I. උපන් දිනය :...................................................................

II. 2017.11.17 දිනට වයස : අවු. :................................, මාස :................................, දින :................................

(සම්මුඛ පරීක්ෂණයේ දී උප්පැන්න සහතිකයේ මුල් පිටපත ඉදිරිපත් කළ යුතුය.)

III. ජා. හැ. අංකය :...................................................................

05. *අධ්‍යාපන සුදුසුකම්* :

(සහතික මගින් සනාථ කළ යුතුය. සම්මුඛ පරීක්ෂණයේදී සහතිකවල මුල් පිටපත් ඉදිරිපත් කළ යුතුය.)

අ.පො.ස. (සා.පෙළ) විභාගය :

වර්ෂය :................................ විභාග අංකය :................................

| *විෂයය* | *ලබා ඇති සාමාර්ථය* |
|---|---|
| 1. ................................................................... | .......................................... |
| 2. ................................................................... | .......................................... |
| 3. ................................................................... | .......................................... |
| 4. ................................................................... | .......................................... |
| 5. ................................................................... | .......................................... |
| 6. ................................................................... | .......................................... |
| 7. ................................................................... | .......................................... |
| 8. ................................................................... | .......................................... |

අ.පො.ස. (උ.පෙළ) විභාගය :

වර්ෂය :................................ විභාග අංකය :................................

| *විෂයය* | *ලබා ඇති සාමාර්ථය* |
|---|---|
| 1. ................................................................... | .......................................... |
| 2. ................................................................... | .......................................... |
| 3. ................................................................... | .......................................... |
| 4. ................................................................... | .......................................... |

06. මෙම බඳවා ගැනීමේ *ගැසට් නිවේදනයේ* 04 අනුව ඉල්ලුම් කරන තනතුරට අදළ වෘත්තීය සුදුසුකම් :

පාඨමාලාවේ නම :.............................................................................................................................................................

පාඨමාලාවේ කාල සීමාව :.................................... සිට .......................................... දක්වා

පාඨමාලාව හදාරන ලද ආයතනය :.......................................................................................................................

සහතිකවල වලංගු දිනය :..................................................................

............................................................................................ වන මා විසින් මෙම අයදුම්පතෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි බව සහතික කරමි. මෙහි මා විසින් සපයන ලද තොරතුරු අසත්‍ය බව හෝ සාවද්‍ය බව හෙළි වුවහොත් එසේ සාවද්‍ය බව හෙළි වූයේ තෝරාගැනීමට පෙර නම් මෙම තනතුර සඳහා මා නුසුදුස්සෙකු බවත්, තෝරා ගැනීමෙන් පසු හෙළි වුවහොත් කිසිදු වන්දියක් නොමැතිව මා සේවයෙන් පහකිරීමට යටත් වන බවත් දනිමි. තව ද ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ නීති රීතිවලට මම යටත් වන බව ද ප්‍රකාශ කරමි.

..................................................,
අයදුම්කරුගේ අත්සන.

දිනය :............................................

07. *දැනටමත් රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ නියුතු අය සඳහා දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය :*

.............................................................................................. මයා/මිය/මෙය මෙම දෙපාර්තමේන්තුවේ .............................................. වශයෙන් ........................දින සිට සේවය කරන බවත්, පූර්වාසන්න වසර 05 තුළ අවවාද කිරීමක් හැර වෙනත් විනයානුකූල දඬුවමක් ලබා නොමැති බවත්, සේවා කාලය තුළ සියලුම වැටුප් වර්ධක උපයාගෙන ඇති/නැති බවත්, පූර්වාසන්න වසර 02 තුළ වැටුප් රහිත නිවාඩු ලබා ඇති/නැති බවත් අයදුම්පතේ සඳහන් කර ඇති තොරතුරු නිලධාරියාගේ පෞද්ගලික ලිපි ගොනුව අනුව පරීක්ෂා කර බැලූ බවත්, ඒවා නිවැරදි බවත් සහතික කරමි.

දිනය :............................................ ......................................................................

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.
(නිල මුද්‍රාව තබන්න.)

10-1064/1

---

## බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික (අර්ධ ශිල්පීය) සේවා ගණයේ බද්ධකරු තනතුර සඳහා බඳවා ගැනීම - 2017

බස්නාහිර පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ බද්ධකරු III ශ්‍රේණියේ තනතුරු පුරප්පාඩු පිරවීම සඳහා පහත සඳහන් සුදුසුකම්ලත් බස්නාහිර පළාතේ ස්ථිර පදිංචිය ඇති ස්ත්‍රී/ පුරුෂ දෙපාර්ශවයෙන්ම අයදුම්පත් කැඳවනු ලැබේ.

1. 1.1 *මාසික වැටුප් පරිමාණය* : මෙම තනතුරට හිමි මාසික වැටුප් පරිමාණය රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 අනුව PL2 - 2016 වන අතර,
රු. 25,250 - 10x270 - 10x300 - 10x330 - 12x350 - රු. 38,450 වේ.
(රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 හි උපලේඛන II ප්‍රකාරව වැටුප් ගෙවනු ලැබේ).

1.2 *දීමනා* : රජය විසින් අනුමත ජීවන වියදම් දීමනා වැටුපට අමතරව ගෙවනු ලැබේ.

2. *වයස් සීමාව* : අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය වන 2017.11.17 දිනට වයස අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි අයදුම්කරුවන් හට මෙම තනතුර සඳහා ඉල්ලුම් කළ හැකිය. පුරප්පාඩු සඳහා බඳවා ගනු ලබන දිනට උපරිම වයස් සීමාව ඉක්මවා නොතිබිය යුතු ය. දැනටමත් රාජ්‍ය සේවයේ/ පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත වූවන්ට උපරිම වයස් සීමාව බල නොපැවැත්වේ.

3. *අධ්‍යාපන සුදුසුකම් හා වෘත්තීය සුදුසුකම් :*

| *තනතුර* | *අධ්‍යාපන සුදුසුකම්* | *වෘත්තීය සුදුසුකම්* |
|---|---|---|
| බද්ධකරු | අධ්‍යාපන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාග යේදී දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයයන් හයක් සමත් වී තිබිය යුතු ය. (එකවර විෂයයන් පහක් (05) සමත් වී තිබීම අනිවාර්ය වේ.) | කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ පුහුණු ආයතනයක හෝ වෙනත් පිළිගත් ආයතනයක පැළ බද්ධ කිරීම මගින් ශාක ප්‍රචාරණය පිළිබඳ අවම වශයෙන් මාස 06ක පුහුණුවක් ලබා තිබිය යුතු අතර, ඒ බව සහතිකයකින් සනාථ කළ යුතු ය. (2017.11.17 දිනට පෙර වලංගු සහතිකයක් විය යුතු ය.) |

4. *අනෙකුත් සුදුසුකම් :*

*(අ)* අයදුම්කරු, ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතු ය.
*(ආ)* මනා චරිතයකින් යුක්ත විය යුතු ය.
*(ඇ)* මනා සෞඛ්‍ය තත්වයකින් යුක්ත විය යුතු ය.
*(ඈ)* 2017.11.17 දිනට පූර්වාසන්න වසර 03 ක කාලය තුළ බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචිය තිබිය යුතු ය.

5. *කායික සුදුසුකම්.*- සෑම අයදුම්කරුවෙකුම බස්නාහිර පළාත තුළ සේවය කිරීමට සහ තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික සහ මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතු ය.

6. *සේවා කොන්දේසි.*- මෙම තනතුර ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිතය. (විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණවලට යටත් විය යුතු ය.)

අනුමත බඳවා ගැනීම් පරිපාටිය අනුව සේවා කොන්දේසි තීරණය වේ.

තෝරාගනු ලබන අයදුම්කරුවන් වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දයක විය යුතු ය.

7. *බඳවා ගැනීමේ ක්‍රමය.*- සුදුසුකම්ලත් අයදුම්කරුවන් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට භාජනය කිරීමෙන් අනතුරුව බඳවා ගැනීමට කටයුතු කරනු ලැබේ.

8. *තනතුරෙහි කාර්යයන්.*- කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ පුහුණු ආයතනයන්හි කාර්යයන් ඉටු කිරීම සඳහා අවශ්‍ය මූලික පහසුකම් සම්පාදනය සඳහා ඒවාට අයත් පැළ තවාන් ඒකක පුළුල්ව පවත්වාගෙන යාමට අවශ්‍ය පරිදි බද්ධ ක්‍රම මගින් අවශ්‍ය ශාක ප්‍රචාරණය සිදුකිරීම හා ඊට අදළ නඩත්තු කටයුතු.

9. *අයදුම් කිරීමේ ක්‍රමය.*- මෙම *ගැසට්* නිවේදනය සමග ඇති ආදර්ශ අයදුම් පත්‍රයට අනුව, ඒ4 ප්‍රමාණයේ (සෙ. මී. 21x23) කඩදසියේ දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් අයදුම්පත සකස් කරගත යුතුය. සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2017.11.17 දින හෝ එදිනට පෙර "ලේකම්, කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග, ධීවර, සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සහ ගොවිජන සංවර්ධන පිළිබඳ අමාත්‍යාංශය (බ.ප.), තැ.පෙ. 566, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත, කොළඹ 07." යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. අයදුම්පත් බහා එවන ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ "බස්නාහිර පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ බද්ධකරු තනතුරු පුරප්පාඩු සඳහා බඳවා ගැනීම - 2017" යනුවෙන් සඳහන් කළ යුතු ය. ප්‍රමාදවී හෝ නියමිත සුදුසුකම් සපුරා නොමැතිව හෝ අසම්පූර්ණව ඉදිරිපත් කරන අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලබන අතර, අයදුම්පත් ලැබුණු බවට දැනුම් දෙනු නොලැබේ.

මෙම නිවේදනයට අනුව, අයදුම්කරුවන්ගේ සුදුසුකම් පරීක්ෂා කරන අවස්ථාවකදී ඔවුන් විසින් අවශ්‍ය සුදුසුකම් සපුරා නොමැති බව අනාවරණය වුවහොත් එම අයගේ පත්වීම ලැබීමට ඇති හිමිකම අවලංගු කරනු ලැබේ. මෙම අයදුම්පත් කැඳවීමේ ගැසට් නිවේදනයේ ඇතුළත් කරුණු හෝ එම නිවේදනයෙන් ආවරණය නොවන වෙනත් කරුණක් වෙතොත් ඒ පිළිබඳව බස්නාහිර පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම්ගේ තීරණය අවසාන තීරණය වන්නේය.

එන්. නිල්වල,
ලේකම්,
කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග, ධීවර, සත්ව නිෂ්පාදන හා
සෞඛ්‍ය සහ ගොවිජන සංවර්ධන පිළිබඳ අමාත්‍යාංශය (බ.ප.).

තැ. පෙ. 566, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත,
කොළඹ 07.

ආදර්ශ අයදුම්පත්‍රය

**බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික (අර්ධ ශිල්පීය) සේවා ගණයේ බද්ධකරු තනතුර සඳහා බඳවා ගැනීම - 2017**

01. *(අ)* මුලකුරු සමග නම :.......................................................................................................

*(ආ)* මුලකුරුවලින් හැඳින්වෙන නම් :..........................................................................................

.......................................................................................................

*(ඇ)* ජාතික හැඳුනුම්පත් අංකය :...........................................................................

02. ස්ථිර ලිපිනය :.......................................................................................................

03. රාජකාරි ලිපිනය :.......................................................................................................

04. ස්ත්‍රී/ පුරුෂ භාවය :...........................................................................

05. *(අ)* ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :........................................................................................

*(ආ)* දුරකථන අංකය : පෞද්ගලික :............................................... රාජකාරී :............................................

06. *(අ)* උපන් දිනය : වර්ෂය :..............................., මාසය :..............................., දිනය :...............................

*(ආ)* 2017.11.17 දිනට වයස : අවු. :..............................., මාස :..............................., දින :...............................

(සම්මුඛ පරීක්ෂණයේ දී උප්පැන්න සහතිකයේ මුල් පිටපත ඉදිරිපත් කළ යුතුය.)

07. *අධ්‍යාපන සුදුසුකම් :*

(සහතික මගින් සනාථ කළ යුතුය. සම්මුඛ පරීක්ෂණයේදී සහතිකවල මුල් පිටපත් ඉදිරිපත් කළ යුතුය.)

අ.පො.ස. (සා.පෙළ) විභාගය :

විභාගයට පෙනී සිටි වර්ෂය :............................... විභාග අංකය :...............................

| *විෂයය* | *ලබා ඇති සාමාර්ථය* |
|---|---|
| 1. ............................................................... | .......................................... |
| 2. ............................................................... | .......................................... |
| 3. ............................................................... | .......................................... |
| 4. ............................................................... | .......................................... |
| 5. ............................................................... | .......................................... |
| 6. ............................................................... | .......................................... |
| 7. ............................................................... | .......................................... |
| 8. ............................................................... | .......................................... |

08. *වෘත්තීය සුදුසුකම් :*

පුහුණුව ලබාගත් ආයතනය :...........................................................................................................................................

පුහුණු කාල සීමාව :...................................................................................

සහතිකය වලංගු වන දිනය :.............................................................................................................................

(සහතික මගින් සනාථ කළ යුතු ය. සම්මුඛ පරීක්ෂණයේ දී සහතිකවල මුල්පිටපත් ඉදිරිපත් කළ යුතු ය)

09. *පළපුරුද්ද :*

*(අ)* සේවය කළ/ කරන ආයතනයේ නම :..................................................................................
*(ආ)* සේවා කාලය :..................................................................................
(ලිපි මගින් සනාථ කළ යුතු ය.)

10. ..............................................................වන මා විසින් මෙම අයදුම්පතෙහි සඳහන් කර ඇති තොරතුරු මගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි බව සහතික කරමි. මා විසින් සපයා ඇති කිසියම් හෝ තොරතුරක් සාවද්‍ය යැයි මෙම තනතුරට තෝරා ගැනීමට පෙර හෙළිදරව් වුවහොත් මෙම තනතුර සඳහා මා නුසුදුස්සෙකු බවට පත් වන බවත්, පත් කිරීමෙන් පසුව වරද අනාවරණය වුවහොත් කිසිදු වන්දියක් නොමැතිව මා සේවයෙන් පහ කළ හැකි බවත් මම හොඳාකාරවම දනිමි. තවද ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ නීතිරීතිවලට මම යටත් වන බවද ප්‍රකාශ කරමි.

..................................................,
අයදුම්කරුගේ අත්සන.

දිනය :............................................

11. *දැනටමත් රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ නියුතු අය සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය :*

........................................................................................................................ මහතා/ මිය/ මෙනවිය ....................................................වැනි දින සිට ............................................................................... ආයතනයේ ............................................................. වශයෙන් සේවය කරන බවත්, පූර්වාසන්න වසර 05 තුළ අවවාද කිරීමක් හැර වෙනත් විනයානුකූල දඬුවමක් ලබා නොමැති බවත්, සියලුම වැටුප් වර්ධක උපයාගෙන ඇති බවත්, පූර්වාසන්න වසර 02 තුළ වැටුප් රහිත නිවාඩු ලබා නොමැති බවත් සඳහන් කරමි.

දිනය :............................................

...........................................................................................
ආයතන ප්‍රධානියාගේ/දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ
අත්සන හා නිල මුද්‍රාව.

10-1064/2

---

**බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ ප්‍රාථමික අර්ධ ශිල්පීය සේවා ගණයේ අරක්කැමි III ශ්‍රේණියේ තනතුරට බඳවා ගැනීම (බස්නාහිර පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව)**

බස්නාහිර පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අරක්කැමි III ශ්‍රේණියේ තනතුරු පුරප්පාඩු පිරවීම සඳහා පහත සඳහන් සුදුසුකම්ලත් බස්නාහිර පළාතේ ස්ථිර පදිංචිය ඇති ස්ත්‍රී/ පුරුෂ දෙපාර්ශවයෙන්ම අයදුම්පත් කැඳවනු ලැබේ.

1. 1.1 *මාසික වැටුප් පරිමාණය :* මෙම තනතුරට හිමි මාසික වැටුප් පරිමාණය රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 අනුව PL2 - 2016 වන අතර,
රු. 25,250 - 10x270 - 10x300 - 10x330 - 12x350 - රු. 38,450 වේ.
(රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 හි උපලේඛන II ප්‍රකාරව වැටුප් ගෙවනු ලැබේ).

1.2 *දීමනා :* රජය විසින් අනුමත ජීවන වියදම් දීමනා වැටුපට අමතරව ගෙවනු ලැබේ.

2. *වයස් සීමාව :* අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය වන 2017.11.17 දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි අයදුම්කරුවන් හට මෙම තනතුර සඳහා ඉල්ලුම් කල හැකිය. පුරප්පාඩු සඳහා බඳවා ගනු ලබන දිනට උපරිම වයස් සීමාව ඉක්මවා නොතිබිය යුතු ය. දැනටමත් රාජ්‍ය සේවයේ නියුක්ත වූවන්ට උපරිම වයස් සීමාව බල නොපැවැත්වේ.

3. *අධ්‍යාපන සුදුසුකම් :* අ.පො.ස. (සා/පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයයන් 06 කට නොඅඩුව යටත් පිරිසෙයින් සම්මාන 02ක් සහිතව සමත් වී තිබිය යුතු ය. (එකවර විෂයයන් 05ක් සමත් වී තිබිය යුතු ය.)

4. *වෘත්තීය සුදුසුකම් :*

අදාළ තනතුරට නියමිත පරිදි තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නියාමනය කරනු ලැබ ඇති පරිදි ජාතික වෘත්තීය කුසලතාවන්හි (NVQ) අවම වශයෙන් දෙවන මට්ටමේ නිපුණතාවයක් ලබාගෙන තිබීම ;

*හෝ*

රජයේ හෝ රජයේ ලියාපදිංචි කරන ලද ආයතනයක් මගින් පවත්වනු ලබන ආහාර පිසීම/ සූපවේදය පිළිබඳව තෙමසකට නොඅඩු වෘත්තීය පාඨමාලාවක් හදාරා තිබීම.

5. *අනෙකුත් සුදුසුකම් :*

5.1 අපේක්ෂකයින් ශ්‍රී ලංකාවේ පුරවැසියන් විය යුතු ය.
5.2 අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පූර්වාසන්න වසර 03 ක කාලය තුළ බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචිය තිබිය යුතු ය.
5.3 යහපත් චරිතයකින් යුක්ත විය යුතු ය.

6. *කායික සුදුසුකම්* : සෑම අපේක්ෂකයෙකුම බස්නාහිර පළාත තුළ සේවය කිරීමට සහ තනතුරේ රාජකාරි ඉටුකිරීමට ප්‍රමාණවත් ශාරීරික සහ මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතු ය.

7. *පළපුරුද්ද* : රජයේ හෝ පෞද්ගලික ආයතනයක වසරකට නොඅඩු කාල සීමාවක් අදාළ තනතුරේ සේවය කර තිබිය යුතු අතර, පළපුරුද්ද පිළිගත හැකි ලේඛන මගින් සනාථ කළ යුතු ය.

8. *සේවා කොන්දේසි* :

* මෙම තනතුර ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිතය.
  (විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණවලට යටත් විය යුතු ය.)
* අනුමත බඳවා ගැනීමේ පරිපාටිය අනුව සේවා කොන්දේසි තීරණය වේ.

9. *තනතුරෙහි කාර්යයන්* :

ආහාර පිළියෙල කිරීම, ආහාර පිළියෙල කරන ස්ථානය පවිත්‍රව මනා ලෙස පවත්වාගෙන යාම, නියමිත ප්‍රමිතීන් හා ආහාර වට්ටෝරු පිළිබඳ අවබෝධයක් ලබාගෙන ආහාර සකස් කිරීම, ආහාර කල්තබා ගැනීම පිළිබඳ විශේෂ ක්‍රමවේදයන් යොදා ගැනීම හා පෝෂණ ගුණය රැකෙන පරිදි ආහාර රසවත්ව පිළියෙල කිරීම.

10. *බඳවා ගැනීමේ ක්‍රමය* :

සුදුසුකම් ලත් අයදුම්කරුවන් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට භාජනය කිරීමෙන් අනතුරුව බඳවා ගැනීමට කටයුතු කරනු ලැබේ.

11. *අයදුම් කිරීමේ ක්‍රමය* :

මෙම *ගැසට්* නිවේදනය සමග ඇති ආදර්ශ අයදුම් පත්‍රයට අනුව, ඒ4 ප්‍රමාණයේ (සෙ. මී. 21x23) කඩදාසියේ දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් අයදුම්පත සකස් කරගත යුතුය. සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2017.11.17 දිනට පෙර "ලේකම්, කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග, ධීවර, සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සහ ගොවිජන සංවර්ධන පිළිබඳ අමාත්‍යාංශය (බ.ප.), තැ.පෙ. 566, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත, කොළඹ 07." යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. අයදුම්පත් බහා එවන ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ "බස්නාහිර පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අරක්කැමි III ශ්‍රේණියේ තනතුරු පුරප්පාඩු සඳහා බඳවා ගැනීම - 2017" යනුවෙන් සඳහන් කළ යුතු ය. (දැනටමත් රාජ්‍ය/ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර සේවයේ නියුතු අයදුම්කරුවන් තම අයදුම්පත් සේවා ප්‍රධානියා මගින් එවිය යුතු ය.) ප්‍රමාදවී ලැබෙන අයදුම්පත් කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් ලැබුණු බවට දැනුම් දෙනු නොලැබේ.

මෙම නිවේදනය අනුව, අයදුම්කරුවන්ගේ සුදුසුකම් පරීක්ෂා කරන අවස්ථාවක දී ඔවුන් විසින් අවශ්‍ය සුදුසුකම් සපුරා නොමැති බව අනාවරණය වුවහොත් එම අයගේ පත්වීම ලැබීමට ඇති හිමිකම අවලංගු කරනු ලැබේ. මෙම අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ ඇතුළත් කරුණු හෝ එම නිවේදනයෙන් ආවරණය නොවන වෙනත් කරුණක් වෙතොත් ඒ පිළිබඳව බස්නාහිර පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශ ලේකම්ගේ තීරණය අවසාන තීරණය වන්නේය.

එන්. නිල්වල,
ලේකම්,
කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග, ධීවර, සත්ව නිෂ්පාදන හා
සෞඛ්‍ය සහ ගොවිජන සංවර්ධන පිළිබඳ අමාත්‍යාංශය (බ.ප.).

තැ. පෙ. 566, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත,
කොළඹ 07.

ආදර්ශ අයදුම්පත

**බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ ප්‍රාථමික අර්ධ ශිල්පීය සේවා ගණයේ අරක්කැමි III ශ්‍රේණියේ තනතුරට බඳවා ගැනීම**
**(බස්නාහිර පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව)**

01. I. මුලකුරු සමග නම :........................................................................................................................................

II. මුලකුරුවලින් හැඳින්වෙන නම් :..............................................................................................................

........................................................................................................................................

02. I. ස්ථිර ලිපිනය :........................................................................................................................................

II. රාජකාරි ලිපිනය :........................................................................................................................................

III. දුරකථන අංකය : පෞද්ගලික :............................................... රාජකාරි :...............................................

03. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :..........................................................................................

04. I. උපන් දිනය :..................................................................

II. 2017.11.17 දිනට වයස : අවු. :..............................., මාස :..............................., දින :...............................

(සම්මුඛ පරීක්ෂණයේ දී උප්පැන්න සහතිකයේ මුල් පිටපත ඉදිරිපත් කළ යුතු ය.)

III. ජා. හැ. අංකය :................................................................

05. *අධ්‍යාපන සුදුසුකම් :*

(සහතික මගින් සනාථ කළ යුතුය. සම්මුඛ පරීක්ෂණයේ දී සහතිකවල මුල් පිටපත් ඉදිරිපත් කළ යුතු ය.)

05.1 අ.පො.ස. (සා.පෙළ) විභාගය :

විභාගයට පෙනී සිටි වර්ෂය :............................... විභාග අංකය :...............................

| | *විෂය* | *ලබා ඇති සාමාර්ථය* |
|---|---|---|
| 1. | .................................................................. | .......................................... |
| 2. | .................................................................. | .......................................... |
| 3. | .................................................................. | .......................................... |
| 4. | .................................................................. | .......................................... |
| 5. | .................................................................. | .......................................... |
| 6. | .................................................................. | .......................................... |
| 7. | .................................................................. | .......................................... |
| 8. | .................................................................. | .......................................... |

06. වෘත්තීය සුදුසුකම් :

(බඳවා ගැනීමේ නිවේදනයේ අංක 04 අනුව ඉල්ලුම් කරන තනතුරට අදාළ වෘත්තීය සුදුසුකම්.)

හදාරන ලද පාඨමාලාවේ නම :..............................................................
පාඨමාලාවේ කාල සීමාව :................................................ සිට ......................................... දක්වා
පාඨමාලාව හදාරන ලද ආයතනය :...............................................................
සහතිකය වලංගු දිනය :...............................................................

07. මෙම බඳවා ගැනීමේ නිවේදනයේ අංක 07. අනුව ඉල්ලුම් කරන තනතුරට අදල පළපුරුද්ද පිළිබඳ විස්තර :

........................................................................................ වන මා විසින් මෙම අයදුම්පතෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි බව සහතික කරමි. මෙහි මා විසින් සපයන ලද තොරතුරු අසත්‍ය බව හෝ සාවද්‍ය බව හෙළි වුවහොත් එසේ සාවද්‍ය බව හෙළි වූයේ තෝරා ගැනීමට පෙර නම් මෙම තනතුර සඳහා මා නුසුදුස්සෙකු වන බවත්, තෝරා ගැනීමෙන් පසු හෙළිවුවහොත් කිසිදු වන්දියක් නොමැතිව මා සේවයෙන් පහ කිරීමට යටත් වන බවත් දනිමි. තවද ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ නීති රීතිවලට මම යටත් වන බවද ප්‍රකාශ කරමි.

.................................................................

අයදුම්කරුගේ අත්සන.

දිනය :.............................................

08. දැනටමත් රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ නියුතු අය සඳහා දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය :

........................................................................................ මයා/මිය/මෙය මෙම දෙපාර්තමේන්තුවේ .............................................. වශයෙන් ........................දින සිට සේවය කරන බවත්, පූර්වාසන්න වසර 05 තුළ අවවාද කිරීමක් හැර වෙනත් විනයානුකූල දඬුවමක් ලබා නොමැති බවත්, සේවා කාලය තුල සියළුම වැටුප් වර්ධක උපයාගෙන ඇති/නැති බවත්, පූර්වාසන්න වසර 02 තුළ වැටුප් රහිත නිවාඩු ලබා ඇති/නැති බවත් අයදුම්පතේ සඳහන් කර ඇති තොරතුරු නිලධාරියාගේ පෞද්ගලික ලිපි ගොනුව අනුව පරීක්ෂා කර බැලූ බවත්, ඒවා නිවැරදි බවත් සහතික කරමි.

.......................................................................

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.
(නිල මුද්‍රාව තබන්න.)

දිනය :.............................................

10-1064/3

---

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

### දකුණු පළාත් රාජ්‍ය සේවයේ මැණුම් ක්ෂේත්‍ර සහායක සේවයේ III වැනි ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2017

1.0 අංක 243 හා 2014.03.21 වැනි දිනැතිව දකුණු පළාත් ගරු ආණ්ඩුකාරවර විසින් අනුමත කරන ලද හා 2015.04.22 හා 2017.08.07 වැනි දිනැතිව සංශෝධිත කරන ලද දකුණු පළාත් රාජ්‍ය සේවයේ මැණුම් ක්ෂේත්‍ර සහායක සේවා ව්‍යවස්ථා සංග්‍රහයෙහි විධිවිධාන අනුව දකුණු පළාත් රාජ්‍ය සේවයේ මැණුම් ක්ෂේත්‍ර සහායක සේවයේ III වැනි ශ්‍රේණියේ තනතුරට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය සඳහා සුදුසුකම්ලත් දකුණු පළාතේ අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. පුරප්පාඩු සංඛ්‍යාව 02 කි. අයදුම්පත් කැඳවීමේ අවසාන දිනය 2017.11.30 දින වන අතර මෙම විභාගය 2017 දෙසැම්බර් මස ගාල්ල නගරයේ දී පවත්වනු ලබයි.

2.0 දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පවත්වනු ලබන ලිඛිත පරීක්ෂණයක ප්‍රතිඵල මත කුසලතා අනුපිළිවෙල අනුව සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන්ගෙන් බඳවා ගැනීම සිදු කෙරේ. පවතින පුරප්පාඩු සංඛ්‍යාවෙන් 100% ක් විවෘත තරග විභාගයෙන් බඳවා ගන්නා අතර බඳවා ගන්නා සංඛ්‍යාව තීරණය කිරීමේ බලය දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු ය.

3.0 පත් කරනු ලබන සංඛ්‍යාව හා පත්වීම ක්‍රියාත්මක වන දිනය පත්වීම් බලධරයා විසින් නිශ්චය කරනු ලැබේ. කිසියම් ඇබෑර්තු සංඛ්‍යාවක් හෝ ඇබෑර්තු සියල්ල ම හෝ නොපිරවීමට පත්වීම් බලධරයාට බලය ඇත.

4.0 *වැටුප* : අංක 03/2016 හා 2016.02.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට අනුව, දකුණු පළාත් රාජ්‍ය සේවයේ මැණුම් ක්ෂේත්‍ර සහායක සේවයේ III වැනි ශ්‍රේණියට අදල වැටුප් කාණ්ඩය PL2-2016 වන අතර මාසික වැටුප් පරිමාණය රු. 25,250-10x270-10x300-10x330-12x350-රු. 38,450 වේ. එම චක්‍රලේඛනයේ උපලේඛන II අනුව 2017.01.01 දින සිට 2017.12.31 දින දක්වා අදළ වනුයේ රු. 17,426 ක මූලික වැටුපක් හා රු. 7,366 ක ගැලපුම් දීමනාවකි.

5.0 මෙම තනතුර ස්ථිරය.

6.0 *සුදුසුකම්* :- දකුණු පළාත් රාජ්‍ය සේවයේ මැණුම් ක්ෂේත්‍ර සහායක සේවයේ III වැනි ශ්‍රේණියේ තනතුරුවලට බඳවා ගැනීම සඳහා පහත සඳහන් සුදුසුකම් අදාළ වේ.

I. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතු ය. දැනටමත් රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දරන අය සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

II. අයදුම්කරු ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතු ය.

III. මනා ශාරීරික හා මානසික සෞඛ්‍ය තත්වයකින් හා විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතු ය.

IV. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට පූර්වාසන්නයේ වසර 05 ක කාලය තුළ දකුණු පළාත් සභා බල ප්‍රදේශයේ අනුගාමී වසර 03 ක ස්ථිර පදිංචිය සනාථ කළ යුතුය. පදිංචිය සනාථ කිරීම සඳහා සම්මුඛ පරීක්ෂණයේ දී පහත සඳහන් ලිපි ලේඛන ඉදිරිපත් කළ යුතු ය.

(අ) මැතිවරණ කොමසාරිස් විසින් නිකුත් කරන ලද ඡන්දහිමි නාම ලේඛන උද්ධෘතය.
(ආ) ප්‍රාදේශීය ලේකම් වසින් අනු අත්සන් කරන ලද ග්‍රාම නිලධාරී විසින් නිකුත් කරන පදිංචි සහතිකය

V. මෙම අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට ප්‍රථම පහත සඳහන් අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් සපුරා තිබිය යුතු ය.

*අධ්‍යාපන සුදුසුකම්* :- අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයයන් හයක් (06) සමත් වී තිබිය යුතුය.

*වෘත්තීය සුදුසුකම්* :- අදාළ තනතුරට නියමිත පරිදි තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිගමනය කරනු ලැබ ඇති පරිදි ජාතික වෘත්තීය කුසලතාවයන්හි අවම වශයෙන් දෙවන මට්ටමේ (NVQ 2) නිපුණතාවයක් ලබාගෙන තිබිය යුතුය.

*අවම නිපුණතා* :

i. මැණුම් ක්ෂේත්‍ර හඳුනාගැනීමට සහාය වීම.
ii. මැණුම් උපකරණ හා ආම්පන්න ආරක්ෂා කිරීම හා නඩත්තුව.

7.0 *විභාග පරිපාටිය* :- මෙම විභාගය ප්‍රශ්න පත්‍ර දෙකකින් යුක්ත වේ. සිංහල / දෙමළ සහ ඉංග්‍රීසි මාධ්‍යවලින් මෙම විභාගය පැවැත්වෙන අතර, ඉල්ලුම්කරන මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.

| | *විෂයය* | *ලකුණු* | *කාලය* |
|---|---|---|---|
| (I) | සාමාන්‍ය දැනීම | 100 යි | පැය 02 යි |
| (II) | බුද්ධි පරීක්ෂණය | 100 යි | පැය 01 යි විනාඩි 15 |

ඉහත විෂයන්ට අදාළ විෂය නිර්දේශ පහත පරිදි වේ.

7.1 *සාමාන්‍ය දැනීම* :-

අපේක්ෂකයා වාසය කරන පරිසරය ඇතුළුව ශ්‍රී ලංකාවේ දේශපාලනමය, සමාජමය, සංස්කෘතික, ආගමික හා කාර්මික සංවර්ධනය ද, අන්තර්ජාතිකව වැදගත් වන සාමාන්‍ය කරුණු පිළිබඳ දැනුම අපේක්ෂා කෙරේ.

7.2 *බුද්ධි පරීක්ෂණය* :- අපේක්ෂකයාගේ සිතීමේ ශක්තිය, තර්කානුකූලභාවය, අවස්ථානෝචිත තීරණ ගැනීමේ හැකියාව මැනීම සඳහා වූ බහුවරණ ක්‍රමයට සකස් කෙරෙන ප්‍රශ්න පත්‍රයකි.

පත්වීම් සඳහා සුදුසුකම් ලැබීමට එක් එක් විෂයය සඳහා වෙන් කර ඇති ලකුණුවලින් යටතේ පිරිසෙයින් සියයට හතලිහක් බැගින්වත් (40%) අපේක්ෂකයකු විසින් ලබාගත යුතුවන අතර, පුරප්පාඩු ගණන සපුරාලන පරිදි ලබාගත් ලකුණු අනුපිළිවෙල තරයේ ම අනුගමනය කරමින් සුදුසුකම් පරීක්ෂා කිරීමේ සම්මුඛ පරීක්ෂණයක් මගින් බඳවා ගනු ලැබේ.

ලිඛිත විභාගයේ ප්‍රතිඵල සියලුම අයදුම්කරුවන් වෙත නිකුත් කරනු ඇත.

8.0 *විභාග ගාස්තු* :- විභාග ගාස්තුව රු. 400/- කි. මෙම මුදල දකුණු පළාත් ප්‍රධාන ලේකම්ගේ ආදායම් ශීර්ෂ 2003-02-13 ට බැරවන ලෙස දකුණු පළාත තුළ පිහිටි ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට ගෙවා අයදුම්කරුගේ නමින් වූ ලදුපත අයදුම්පතේ අදාළ කොටුවේ නොගැළවෙන සේ ඇලවිය යුතු ය. (ලදුපතේ ඡායාස්ථ පිටපතක් මතු ප්‍රයෝජනය සඳහා ළඟ තබා ගත යුතු ය.) කිසිම හේතුවක් නිසාවත් විභාග ගාස්තු ආපසු ගෙවනු නොලබන අතර, විභාග ගාස්තුව සඳහා මුද්දර හෝ මුදල් ඇණවුම් භාරගනු නොලබන අතර, තැපැල් හෝ උප තැපැල් කාර්යාලවලට ගෙවන ලද මුදල් ද භාරගනු නොලැබේ.

9.0 *අයදුම්පත්‍ර* :- ඒ4 (සෙ.මී. 21 x 29) (සාමාන්‍ය හාෆ්ෂීට්) ප්‍රමාණයේ කඩදාසි භාවිත කරමින් -

*(අ)* අංක 01 සිට 03 තෙක් ඡේදයන් පළමුවන පිටුවට ද,

*(ආ)* අංක 04 සිට ඉදිරියට වන ඡේදයන් අනෙක් පිටුවලට ද, ඇතුළත්වන සේ කඩදාසියේ දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් අයදුම්පත්‍රය පිළියෙල කරගත යුතු අතර අපේක්ෂකයා විභාගයට පෙනී සිටීමට අදහස් කරන භාෂාවෙන්ම අයදුම්පත්‍රය පිරවිය යුතු ය.

*(ඇ)* අයදුම්පත්‍රය පිළියෙල කර ගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල අයදුම්පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ අයදුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද සඳහන් කළ යුතු ය.

නියමිත ආදර්ශ ආකෘතියට අනුකූල නොවන, නියමිත දිනට පෙර විභාග ගාස්තු ගෙවා නොමැති හා නිවැරදිව සම්පූර්ණ කර නොමැති අසම්පූර්ණ තත්ත්වයේ පවතින අයදුම්පත්‍ර කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. නිසි පරිදි අයදුම්පත්‍ර සම්පූර්ණ නොකිරීමෙන් සිදුවන පාඩුව අයදුම්කරුවන් විසින් දරාගත යුතුය. අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇති අතර, සම්පූර්ණ කරනු ලබන අයදුම්පත්‍රය විභාග නිවේදනයේ දක්වෙන අයදුම්පත්‍රයට අනුකූල ද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතු වේ. එසේ නොවුනහොත් අයදුම්පත ප්‍රතික්ෂේප විය හැක. අයදුම්පත් දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවිය වන www.psc.sp.gov.lk මගින් ද ලබා ගත හැකි ය.

9.1 *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නියමිත විභාග ගාස්තු ගෙවා නියමිත දිනට හෝ එදිනට පෙර හෝ සෑම අතින් ම සම්පූර්ණ අයදුම්පත්‍ර ඉදිරිපත් කර ඇති සියලු අයදුම්කරුවන්ට තරග විභාගයට පෙනී සිටීමට දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ලැබේ. තරග විභාගයට පෙනී සිටීම සඳහා ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම අයදුම්කරු මෙම තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ. අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවා *ගැසට්* නිවේදනය අනුව සුදුසුකම් තිබේදැයි පරීක්ෂා කරන අවස්ථාවේ අවශ්‍ය සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් එම අයගේ විභාග අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

9.2 අයදුම්පත්‍රය බහා එවන කවරයේ වමත් පස ඉහළ කෙළවරේ "දකුණු පළාත් රාජ්‍ය සේවයේ මැණුම් ක්ෂේත්‍ර සහායක සේවයේ III වැනි ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2017" යන්න සඳහන් කරන්න.

9.3 අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයකු, සාමදාන විනිශ්චයකාරවරයකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරි බලයලත් නිලධාරිවරයකු, පොලිස් සේවයේ *ගැසට්* කළ තනතුරක් දරන නිලධාරියකු, වාර්ෂික වැටුප රු. 240,360/- ක් හෝ ඊට වැඩි රජයේ ස්ථිර තනතුරක් දරන මාණ්ඩලික නිලධාරියකු හෝ විසින් සහතික කරනු ලැබ තිබිය යුතුය.

9.4 සම්පූර්ණ කරන ලද අයදුම්ත්‍රය 2017 නොවැම්බර් මස 30 දින හෝ ඊට පෙර පහත දක්වෙන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

ලේකම්,
දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
6 වන මහළ, දිස්ත්‍රික් ලේකම් කාර්යාල සංකීර්ණය,
ගාල්ල.

10.0 *විභාගයට පෙනී සිටීම*.- අයදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව හා විභාග දිනය දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවියේ පළ කරනු ඇත. ඒ අනුව ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම් ඒ බව දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත දන්වා සිටිය යුතුය. "ඔබ වෙත තබාගත් පිටපත, විභාග ගාස්තු ගෙවීමෙන් ලද කුවිතාන්සියේ පිටපත සහ ඉල්ලුම්පත්‍රය තැපෑලෙන් යොමු කිරීමේ දී ලියාපදිංචි කරන ලද කුවිතාන්සිය ද අතැතිව විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය සඳහන් කරමින් දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් විමසන ලෙස දන්වන අතර, ෆැක්ස් මගින් ප්‍රවේශ පත්‍රයේ පිටපතක් ලබා ගැනීමට ඔබගේ ෆැක්ස් අංකය ද සමග ඉහත ඔබගේ විස්තර ඇතුළත් ඉල්ලීම් ලිපියක් දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ෆැක්ස් මගින් යොමු කරමින් විමසා සිටීම ද වඩාත් ප්‍රතිඵලදායී වනු ඇත."

අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් සේ නොසැලකිය යුතු ය. සෑම අපේක්ෂකයකුම විභාගය ආරම්භ වන දිනයේ විභාග ශාලාධිපති වෙත තම අත්සන සහතික කරන ලද ප්‍රවේශ පත්‍රයක් ඉදිරිපත් කළ යුතු ය.

11.0 අපේක්ෂකයින්ගේ අනන්‍යතාව සනාථ කිරීම සඳහා පහත සඳහන් ලියකියවිලිවලින් එකක් විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතු ය.

(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත,
(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය.

12.0 විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවනු ලබන නීති රීතිවලට විභාග අපේක්ෂකයන් යටත් වේ. එම නීති රීති උල්ලංඝනය කළහොත් දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

13.0 මෙහි සඳහන් නොවන යම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධව දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ඇත. සියලුම අයදුම්කරුවන් මෙම *ගැසට් නිවේදනයේ* සඳහන් පොදු විභාග නීති රීති අනුව කටයුතු කිරීමට බැඳී සිටිනු ඇත.

යූ. ජී. විදුර කාරියවසම්,
ලේකම්,
දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

2017 ඔක්තෝබර් මස 09 වැනි දින,
දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය,
6 වන මහල,
දිස්ත්‍රික් ලේකම් කාර්යාල ගොඩනැගිල්ල,
ගාල්ල.

ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය : [ ]

**ආදර්ශ අයදුම්පත්‍රය**

***දකුණු පළාත් රාජ්‍ය සේවයේ මැනුම් ක්ෂේත්‍ර සහායක සේවයේ III වැනි ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2017***

***Open Competitive Examination for Recruitment to Class III of Southern Provincial Survey Field Assistants Service - 2017***

[ ]
(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය :

සිංහල - 2
දෙමළ - 3 [ ]
ඉංග්‍රීසි - 4
(අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

1.0 1.1 මුලකුරු අගට යොද මුලකුරු සමග නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :.......................................................................

.......................................................................
(උදා. : GUNAWARDHANA H.M.S.K.)

1.2 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :...........................................................................................................

.........................................................................................................................................................

(උද. : HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDHANA)

1.3 සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :..................................................................................................................

.........................................................................................................................................................

1.4 ජාතික හැඳුනුම්පත් අංකය : | | | | | | | | | | |

2.0 2.1 ස්ථිර ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :............................................................................................................

.........................................................................................................................................................

2.2 ස්ථිර ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්) :...................................................................................................................

.........................................................................................................................................................

2.3 ප්‍රවේශ පත්‍ර එවිය යුතු ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :........................................................................................

.........................................................................................................................................................

3.0 3.1 ස්ත්‍රී/පුරුෂ භාවය : ස්ත්‍රී - 1
පුරුෂ - 0
(අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

3.2 උපන් දිනය : වර්ෂය : | | | | | මාසය : | | | දිනය : | | |

3.3 2017.11.30 දිනට වයස : අවුරුදු : | | | මාස : | | | දින : | | |

3.4 අයදුම්කරු ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :......................................................................................

3.5 දුරකතන අංකය : | | | | | | | | | | |

3.6 විද්‍යුත් තැපැල් ලිපිනය (E-mail address) :.........................................................................................

4.0 *අධ්‍යාපන සුදුසුකම් :*

4.1 අ.පො.ස. (සා.පෙළ) විභාගය පිළිබඳ විස්තර :-

(i) විභාගයේ වර්ෂය හා මාසය :...................................................................................

(ii) විභාග අංකය :...................................................................................

(iii) ප්‍රතිඵල :...................................................................................

| | *විෂයය* | *ශ්‍රේණිය* | | *විෂයය* | *ශ්‍රේණිය* |
|---|---|---|---|---|---|
| 1. | | | 6. | | |
| 2. | | | 7. | | |
| 3. | | | 8. | | |
| 4. | | | 9. | | |
| 5. | | | 10. | | |

4.2 ලබා ඇති වෘත්තීය සුදුසුකම් :-

| උපාධිය/ඩිප්ලෝමා/ වෘත්තිය සහතිකයේ නම | වලංගු වන දිනය | විෂයයන් | සාමාර්ථතාව | විශ්ව විද්‍යාලය/නිකුත් කළ ආයතනයේ නම |
|---|---|---|---|---|
| | | | | |

5.0 වෙනත් සුදුසුකම් :.......................................................................................................................................

6.0 ඔබ කවරදක හෝ කවර හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේ ද?

(අදාළ කොටුවේ ✓ලකුණ යොදන්න.) (ඔව් නම් විස්තර සඳහන් කරන්න.)

ඔව් : ☐ නැත : ☐

7.0 විභාග ගාස්තු ගෙවූ ලදුපත පිළිබඳ විස්තර :-

(i) විභාග ගාස්තු ගෙවූ කාර්යාලය :...........................................................................................

(ii) ලදුපත් අංකය හා දිනය :...........................................................................................

(iii) ගෙවූ මුදල :...........................................................................................

ලදුපත නොගැලවෙන සේ මෙහි අලවන්න.
(ලදුපතේ ඡායාස්ථ පිටපතක් ළඟ තබා ගන්න.)

8.0 දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු වූවෙකු නම්,

8.1 දෙපාර්තමේන්තුව/ආයතනය :...........................................................................................
8.2 දැනට දරන තනතුර :...........................................................................................
8.3 පත්වීම් දිනය :...........................................................................................
8.4 සේවා කාලය :- අවු. :...........................................................................
8.5 ස්ථිර විශ්‍රාම වැටුප් හිමි හෝ තාවකාලික ද යන වග :...........................................................................
(සේවය ස්ථිර කිරීමේ ලිපියේ පිටපතක් අමුණන්න.)

9.0 අයදුම්කරුගේ ප්‍රකාශය :

මෙම අයදුම්පතේ මා විසින් සපයා ඇති තොරතුරු සියල්ල මාගේ දැනීමේ හා විශ්වාසය අනුව නිවැරදි සහ සත්‍ය බවත්, විභාග ගාස්තුව ගෙවූ .......................................... ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ අංක ................. හා ................... දින දරන ලදුපත මෙහි අලවා ඇති බවත්, මෙම තනතුරට මා නුසුදුස්සෙකු බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගයෙන් පසු හෝ පත්වීම් ලැබීමෙන් පසු සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බවත් මම පිළිගනිමි. තවද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවනු ලබන නීතිරීතිවලට මම එකඟ වෙමි.

.......................................
අයදුම්කරුගේ අත්සන.

දිනය :...........................................

10.0 *අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :*

මෙම අයදුම්පත ඉදිරිපත් කරන ................ මහතා / මහත්මිය / මෙනවිය මා පෞද්ගලිකව හඳුනන බවත්,..................... වැනි දින මා ඉදිරිපිටදී ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බවත් සහතික කරමි.

.....................................................,
(සහතික කරන්නාගේ අත්සන.)

දිනය :....................................

සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම :....................................................................................
තනතුර :...............................................................................................
ලිපිනය :...............................................................................................
(නිල මුද්‍රාව තබන්න)

(රාජ්‍ය හෝ පළාත් රාජ්‍ය සේවයේ දැනට සේවයේ නියුතු අයදුම්කරුවකු නම් පහත සඳහන් සහතිකය දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් සහතික කළ යුතුය.)

11.0 *ආයතන ප්‍රධානියාගේ සහතිකය / දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය :*

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන.............................................................................................. මයා/මිය/මෙනවිය ..................... ........................................... කාර්යාලයේ/ආයතනයේ...........................දින සිට.....................................................තනතුරක සේවය කරන බවද, ඔහුගේ/ඇයගේ සේවය සතුටුදායක වන බවද, මෙම විභාගයේ ප්‍රතිඵල අනුව පත්වීමක් සඳහා තෝරාගනු ලැබුවහොත්, ඔහු/ඇය දැනට දරන තනතුරෙන් නිදහස් කළ හැකි බව ද/ කළ නොහැකි බව ද ඇය/ඔහු මෙතෙක් මොනයම් ආකාරයක හෝ විනයානුකූල දඬුවමකට (අවවාද කිරීම් හැර) භාජනය වී නොමැති බවද ඉහත සඳහන් කර ඇති තොරතුරු සත්‍ය බවද සහතික කරමි.

..........................................................................................,
ආයතන ප්‍රධානියා/දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.

දිනය :..........................................

ආයතන ප්‍රධානියා/දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නම :...........................................................
තනතුර :...............................................................................................
ලිපිනය :...............................................................................................
(නිල මුද්‍රාව තබන්න.)

10-1683

---

**මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ (සිවිල්/සැලසුම්) තනතුරු සඳහා බඳවා ගැනීම - 2017**

මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ (සිවිල්/සැලසුම්) III ශ්‍රේණිය, පුහුණු ශ්‍රේණිය යන තනතුරුවල පුරප්පාඩු පිරවීම සඳහා මධ්‍යම පළාත තුළ පදිංචි සුදුසුකම්ලත් ස්ත්‍රී/පුරුෂ දෙපාර්ශවයෙන්ම අයදුම්පත් කැඳවනු ලැබේ.

1. පොදු සුදුසුකම් :

1.1. අයදුම්කරු ශ්‍රී ලාංකික විය යුතුය.

1.2. විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.

1.3. අවශ්‍ය සියලු සුදුසුකම් සම්පූර්ණ කළ යුතු බවට මෙම අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් කරනු ලබන දිනට

පූර්වාසන්නයෙන් වූ වසර 03 ක කාලය තුළ මධ්‍යම පළාත තුළ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුය. (අයැදුම්කරු මෙම පළාතේ වසර 03ට වඩා ස්ථිර පදිංචි අයෙකු සමග විවාහ වූ විට කලත්‍රයාගේ ස්ථිර පදිංචිය සලකා බැලේ.)

1.4. අයැදුම්පත් කැඳවන අවසන් දිනට වයස අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 30 ට නොවැඩි විය යුතුය. (දැනටමත් මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර සේවයේ නියුතු නිලධාරීන්ට මෙම උපරිම වයස් සීමාව බල පවත්වනු නොලැබේ.)

1.5. සෑම අයැදුම්කරුවෙකුම මධ්‍යම පළාත තුළ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

1.6. යම් ආගමික නිකායක පැවිදිවරයක් දරන කිසිදු තැනැත්තෙකුට මෙම තනතුරුවලට ඉල්ලුම් කිරීම සඳහා සුදුසුකම් නොලබයි.

2. අධ්‍යාපන සුදුසුකම් හා තාක්ෂණ සුදුසුකම් ඃ

සියලු අධ්‍යාපන සුදුසුකම් හා තාක්ෂණික සුදුසුකම් 2017.11.25 වැනි දිනට සම්පූර්ණ කර තිබිය යුතුය.

| *තනතුර* | *සියලු තනතුරු සඳහා අ.පො.ස. (සා/පෙළ) සුදුසුකම්* | *එක් එක් තනතුර සඳහා අ.පො.ස. (උ/පෙළ) සුදුසුකම්* | *තාක්ෂණික සුදුසුකම්* |
|---|---|---|---|
| මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ (සිවිල්/සැලසුම්) III ශ්‍රේණිය | සිංහල/දෙමළ/ ඉංග්‍රීසි භාෂාව, විද්‍යාව, ගණිතය, සහ තවත් එක් විෂයයකට සම්මාන සාමාර්ථයක් සහිතව එකවර විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම. | ක්ෂේත්‍රයට අදාළ විෂයන් දෙකක් සහිතව ගණිතය/ තාක්ෂණ වේදය විෂය ධාරාවට අයත් විෂයයන් තුනකින් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හා ඉංග්‍රීසි හැර) අධ්‍යාපන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය එකවර සමත්වීම. | ** සැලකිය යුතුයි* - <br>සිවිල්/විදුලි/යාන්ත්‍රික/සැලසුම් තනතුරු සඳහා ඉල්ලුම් කිරීමේදී තනතුරට අදාළ තාක්ෂණ ඩිප්ලෝමාව ලබා තිබිය යුතුයි.<br>1. මොරටුව විශ්ව විද්‍යාලයේ හෝ අම්පාර හාඩි ආයතනය විසින් පිරිනමනු ලබන ජාතික තාක්ෂණික ඩිප්ලෝමාව (N.D.T) ;<br>*හෝ*<br>2. ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය (NAITA) විසින් පිරිනමනු ලබන ජාතික ඉංජිනේරු විද්‍යා ඩිප්ලෝමාව ;<br>*හෝ*<br>3. අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පිරිනමනු ලබන ජාතික උසස් ඉංජිනේරු ඩිප්ලෝමාව ;<br>*හෝ*<br>4. ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය විසින් පිරිනමනු ලබන තාක්ෂණික ඩිප්ලෝමාව ;<br>*හෝ* |

| තනතුර | සියලු තනතුරු සඳහා අ.පො.ස. (සා/පෙළ) සුදුසුකම් | එක් එක් තනතුර සඳහා අ.පො.ස. (උ/පෙළ) සුදුසුකම් | තාක්ෂණික සුදුසුකම් |
|---|---|---|---|
| | | | 5. ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පවත්වනු ලබන ඉංජිනේරු විභාගයේ පළමුවන කොටස සාර්ථකව සම්පූර්ණ කිරීම.<br>හෝ<br>රැකියා ක්ෂේත්‍රයට අදාළව ජාතික වෘත්තීය කුසලතා (NVQ) 6 මට්ටමේ සුදුසුකම් සම්පූර්ණ කර තිබීම<br>හෝ<br>6. උසස් අධ්‍යාපන අමාත්‍යාංශය හා ඉහත සඳහන් තාක්ෂණ සහතික නිකුත් කරන ආයතනවලින් විමසා අදහස් ලබා ගැනීමෙන් අනතුරුව ඉහත සඳහන් තාක්ෂණික සුදුසුකම්වලට සියළු අතින් සමාන යැයි තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වෙනත් තාක්ෂණික සුදුසුකම් ලබා තිබීම. |
| මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ (සිවිල්/සැලසුම්) පුහුණු ශ්‍රේණිය (එක් වසරක පුහුණු කාලයක් සහිත) | සිංහල/දෙමළ/ ඉංග්‍රීසි භාෂාව විද්‍යාව, ගණිතය, සහ තවත් එක් විෂයයකට සම්මාන සාමාර්ථයක් සහිතව එකවර විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම. | ක්ෂේත්‍රයට අදාළ විෂයයන් දෙකක් සහිතව ගණිතය/ තාක්ෂණවේදය විෂය ධාරාවට අයත් විෂයයන් තුනකින් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හා ඉංග්‍රීසි හැර) අධ්‍යාපන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය එකවර සමත්වීම. | 1. තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් කාර්මික විද්‍යාලයක තනතුරට අදාළ ක්ෂේත්‍රයක පාඨමාලාවක් සාර්ථකව හදාරා ජාතික තාක්ෂණ සහතිකය ( NCT ) ලබා තිබීම. (උදා;- ජාතික තාක්ෂණ සහතිකය සිවිල්/ විදුලි/ යාන්ත්‍රික )<br>හෝ<br>2. තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් කාර්මික විද්‍යාලයක සැලසුම් ශිල්පය පිළිබඳ එක් අවුරුදු පූර්ණකාලීන පුහුණු පාඨමාලාවක් සාර්ථකව සම්පූර්ණ කර අදාළ සහතිකය ලබා තිබීම.<br>හෝ<br>3. තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් කාර්මික විද්‍යාලයක තනතුරට අදාළ ක්ෂේත්‍රයක කර්මාන්ත තාක්ෂණිකයන් |

| *තනතුර* | *සියළු තනතුරු සඳහා අ.පො.ස. (සා/පෙළ) සුදුසුකම්* | *එක් එක් තනතුර සඳහා අ.පො.ස. (උ/පෙළ) සුදුසුකම්* | *තාක්ෂණික සුදුසුකම්* |
|---|---|---|---|
| | | | සඳහා වූ ජාතික තාක්ෂණ පාඨමාලාව සාර්ථකව සම්පූර්ණ කර අදාළ සහතිකය ලබා තිබීම.<br><br>*හෝ*<br><br>4. උසස් අධ්‍යාපන අමාත්‍යාංශය හා ඉහත සඳහන් තාක්ෂණ සහතික නිකුත් කරන ආයතනවලින් විමසා අදහස් ලබාගැනීමෙන් අනතුරුව ඉහත සඳහන් තාක්ෂණික සුදුසුකම්වලට සියලු අතින් සමාන යැයි තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වෙනත් තාක්ෂණික සුදුසුකම් ලබා තිබීම. |

3. *වැටුප් පරිමාණය :*

3.1. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 3/2016 හි MN 3- 2016 අනුව මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ (සිවිල්/සැලසුම්) III ශ්‍රේණියට හිමි වැටුප් පරිමාණය.

රු. 31,040/- - 10 x 445 -11 x 660- 10 x 730 - 10 x 750 - රු 57,500/-
(MN 3- 2016 වැටුප් ක්‍රමය)

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 දරන චක්‍රලේඛයේ උපලේඛන අංක II හි සඳහන් පරිදි වැටුප් ගෙවීම සිදුකරනු ඇත.

පුහුණු කිරීමේ ශ්‍රේණියේ දීමනාව :- රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 හි උපලේඛන අංක : V -19 අනුව.
1 වසර - රු. 18,728.00

4. *බඳවා ගැනීමේ කොන්දේසි :*

මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කර ඇති බඳවා ගැනීමේ පරිපාටි අනුව බඳවා ගැනීමේ කොන්දේසි තීරණය වේ.

5. *බඳවා ගැනීමේ ක්‍රමය :*

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 15/90 හි විධිවිධාන පරිදි දිස්ත්‍රික් ජනගහන අනුපාතය අනුව ඉහත පවත්නා පුරප්පාඩු සඳහා බඳවා ගනු ලැබේ. මේ සඳහා මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පවත්වනු ලබන ලිඛිත පරීක්ෂණයේ දී ලබාගන්නා ලකුණු ප්‍රමුඛතාවය මත සුදුසුකම් පරීක්ෂාකර බැලීමේ සම්මුඛ පරීක්ෂණයකින් අනතුරුව සුදුස්සන් තෝරා ගැනේ. සම්මුඛ පරීක්ෂණයේ දී ලකුණු ලබා දීමක් සිදු නොවන අතර ලිඛිත විභාගයේ දී එක් එක් ප්‍රශ්න පත්‍රය සඳහා 40%ක අවම ලකුණු ප්‍රමාණයක් ලබා නොගන්නා අයැදුම්කරුවන් බඳවාගැනීම සඳහා සලකා බලනු නොලැබේ.

6. *සේවා කොන්දේසි :*

6.1. මෙම තනතුර ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිතය.

6.2. අදාළ පත්වීම රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක වීම සම්බන්ධයෙන් නිකුත්කර ඇති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2014 හා ඊට අදාළ අනෙකුත් චක්‍රලේඛවල සඳහන් විධිවිධානවලට යටත් වේ.

6.3. මෙම තනතුරට පත් කිරීමෙන් අනතුරුව මධ්‍යම පළාත තුළ වසර 05 ක අවම වශයෙන් සේවා කාලයක් අනිවාර්යයෙන් සේවය කළ යුතු අතර එම කාලය තුළදී මධ්‍යම පළාතෙන් පිටතට ස්ථාන මාරු ලබා ගැනීමට හෝ වෙනත් තනතුරකට මුදාහැරීමට කරනු ලබන කිසිදු ඉල්ලීමක් සලකා බලනු නොලැබේ.

7. *අයදුම් කිරීමේ ක්‍රමය :*

7.1. විභාග ගාස්තුව රු. 600/-කි. මෙම විභාග ගාස්තුව මධ්‍යම පළාතේ ප්‍රධාන ලේකම්ගේ ආදායම් ශීර්ෂ 20-03-02-13 ට බැරවන පරිදි මධ්‍යම පළාත තුළ ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට ගෙවා ඒ සඳහා ලබාගත් ලදුපතක් අයදුම්පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැලවෙන සේ ඇලවිය යුතුය. එකී ලදුපත නොමැතිව එවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරන අතර ගෙවන ලද විභාග ගාස්තු කිසිම හේතුවක් මත හෝ ආපසු ගෙවනු නොලබන බව ද සැලකිය යුතුය.

7.2. අයදුම්පත්‍රය මෙම නිවේදනයට අමුණා ඇති ආදර්ශ ආකෘතියට අනුව නිවැරදිව සම්පූර්ණ කොට 2017.11.25 දිනට හෝ ඊට පෙර ලැබෙන සේ "ලේකම්, මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, අංක 244, කටුගස්තොට පාර, මහනුවර" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් ලද බව දන්වනු නොලැබේ. අයදුම්පත බහාලන කවරයේ වම්පස ඉහළ කෙලවරේ "**මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ III ශ්‍රේණියට නිලධාරීන් බඳවා ගැනීම - 2017**" යනුවෙන් සහ පදිංචි දිස්ත්‍රික්කය හා ඉල්ලුම් කරනු ලබන තනතුරට හිමි සංකේත අංකය සඳහන් කළ යුතුය. නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් හා අසම්පූර්ණ අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. තැපෑලේදී අස්ථානගත වන අයදුම්පත් සම්බන්ධයෙන් මෙම කොමිෂන් සභාව වග කියනු නොලැබේ.

7.3. යම් අයදුම්කරුවෙකු තනතුරු එකකට වඩා වැඩි ගණනක් සඳහා අයදුම් කරන්නේ නම් එක් එක් තනතුර සඳහා වෙන වෙනම අයදුම්පත් යොමු කළ යුතු වේ.

8. *විභාග මාධ්‍යය :*

විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයෙන් පවත්වනු ලැබේ. අයදුම්පත්‍රයේ තමන් විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යයට නියමිත අක්ෂරය පැහැදිලිව සඳහන් කළ යුතු අතර එය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.

9. *විභාග මධ්‍යස්ථානය :*

විභාග මධ්‍යස්ථානය පිළිබඳව මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අයදුම්කරුවන්ට විභාග ප්‍රවේශ පත්‍රය මගින් දැනුම් දෙනු ලැබේ.

10. *විභාග විෂය නිර්දේශය :*

මෙම තනතුරුවලට බඳවා ගැනීම සඳහා අයදුම්කරුවන් පහත සඳහන් විෂයයන් හා විෂය නිර්දේශයන් යටතේ ලිඛිත විභාග යකට යොමු කරනු ලැබේ.

1. බුද්ධි පරීක්ෂණය :

කාලය පැය 01 යි. (ලකුණු 100) මෙම ප්‍රශ්න පත්‍රය අපේක්ෂකයාගේ සිතීමේ තර්කානුකූලතාව, විශ්ලේෂණ හැකියාව, කාල කළමනාකරණය විනිශ්චය කිරීම සඳහා වූ ප්‍රශ්නවලින් යුක්තය. සියලුම තනතුරු සඳහා වන අයදුම්කරුවන් පෙනී සිටිය යුතුය.

2. තාක්ෂණ ප්‍රශ්න පත්‍රය :

කාලය පැය 03 යි. (ලකුණු 100) තනතුරට අදාළව තාක්ෂණික දැනුම මැන බැලෙන බහුවරණ හා ව්‍යුහගත මාදිලියේ ප්‍රශ්නවලින් සමන්විත වේ.

*(අ)* මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ (සිවිල්) III ශ්‍රේණියේ / පුහුණු ශ්‍රේණියේ තනතුරු සඳහා :

මෙහිදී සිවිල් නිලධාරියෙකුට තිබිය යුතු දැනුම පරීක්ෂා කිරීම සඳහා ගොඩනැගිලි ඉදි කිරීම් හා නඩත්තු කටයුතු, මාර්ග තැනීම හා නඩත්තුව, ජල සම්පාදන හා ජල ප්‍රවාහය සම්බන්ධ ප්‍රශ්නවලින් සමන්විත වේ.

*(ආ)* මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ (සැලසුම්) III ශ්‍රේණියේ තනතුර සඳහා :

මෙහිදී සැලසුම් නිලධාරියෙකුට තිබිය යුතු දැනුම පරීක්ෂා කිරීම සඳහා සැලසුම් සේවයේ තනතුරු සඳහා පිළිතුරු සැපයිය යුතු කොටසකි.

11. *අයදුම්පත් පිරවීම සඳහා උපදෙස් :*

ආදර්ශ අයැදුම්පත් ආකෘතියට ප්‍රකාර ඒ 4 ප්‍රමාණයක කඩදාසිය දෙපැත්තම භාවිතා කරමින් එහි පළමු පිටුවෙහි අංක 1-5 දක්වා කරුණු ද අනෙක් පිටුවල ඉතිරි ඡේදද ඇතුළත්වන සේ සකස් කර ගත යුතුය. අයැදුම්පත්‍රය යතුරු ලියනය කර ගැනීමෙන් හෝ පැහැදිලි අත් අකුරින් සකස් කර ගත යුතුය. අයැදුම්පත්‍රය පිරවීමේදී පහත දැක්වෙන සංකේත අංක නියමිත කොටුවල පැහැදිලිව සඳහන් කළ යුතුය.

11.1. අයැදුම් කරන දිස්ත්‍රික්කය ලෙස සඳහන් කළ යුත්තේ අයැදුම්කරුගේ ස්ථිර පදිංචිය ඇති දිස්ත්‍රික්කයට අදාළ සංකේත අංකයයි.

| | | |
|---|---|---|
| මහනුවර | - | 01 |
| මාතලේ | - | 02 |
| නුවරඑළිය | - | 03 |

11.1.1 මධ්‍යම පළාත් තාක්ෂණ සේවයේ එක් එක් තනතුර සඳහා වෙන් කර ඇති සංකේත අංක :

| | | |
|---|---|---|
| III ශ්‍රේණිය / පුහුණු ශ්‍රේණිය | සිවිල් | : 01 - C |
| | සැලසුම් | : 01 - D |

අයැදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විදුහලක විදුහල්පතිවරයෙකු, සාමදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, නීතිඥවරයෙකු හෝ ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු හෝ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 ශ්‍රේණිගත කිරීමට අනුව තෘතීය හෝ ජ්‍යෙෂ්ඨ මට්ටමේ රජයේ/පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දරන නිළධාරියකු විසින් සහතික කරනු ලැබ තිබිය යුතුය.

11.2. යම් අයැදුම්කරුවෙකුට සුදුසුකම් නොමැති බව පත්වීම් ලැබීමට පෙර හෝ පත්වීම් ලබා දීමෙන් පසු හෝ ඕනෑම අවස්ථාවකදී අනාවරණය වුවහොත් අපේක්ෂකත්වය හෝ පත්වීම අවලංගු කෙරෙනු ඇත. එසේම දැන දැනම සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කර ඇති බව හෝ නිරවද්‍ය තොරතුරු ඕනෑකමින් යටපත්කර ඇති බව හෝ අනාවරණය වුවහොත් සේවයෙන් පහ කෙරෙනු ඇත.

11.3. රාජ්‍ය සේවයේ හා පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් තම අයදුම්පත් දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුය.

12. මෙම විභාග පැවැත්වීම පිළිබඳව හෝ පැවැත්වීමෙන් පසුව තෝරා ගැනීම් කිරීම/නොකිරීම හෝ පුරප්පාඩු සංඛ්‍යාව පිළිබඳව අවසාන තීරණය මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුය. එසේම මෙම නිවේදනයේ විධිවිධාන සලසා නැති කිසියම් කරුණක් වෙතොත් ඒ ගැන පැහැදිලි කිරීම / තීරණය කිරීම මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වේ.

ආර්.එම්.එන්. රත්නායක,
ලේකම්,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
මධ්‍යම පළාත් සභාව.

2017 ඔක්තෝබර් මස 10 වැනි දින,
මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
අංක 244, කටුගස්තොට පාර,
මහනුවර.

**ආදර්ශ අයදුම්පත්‍රය**

මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ ( සිවිල්/සැලසුම්) තනතුරු සඳහා බඳවා ගැනීම - 2017

විභාග අංකය :

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා)

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය :- ( සිංහල - S, දෙමළ - T, ඉංග්‍රීසි - E )
(අදාළ සංකේතය කොටුව තුළ ලියන්න)

01. තනතුර :- තනතුරට අදළ සංකේත අංකය :-

පදිංචි දිස්ත්‍රික්කය :- දිස්ත්‍රික්කයට අදාළ සංකේත අංකය :-

1.1 මුලකුරු සමඟ නම : ..........
Mr/Mrs/Miss. (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

1.2 මුලකුරු සමග නම : ..........
මයා/මිය/මෙනවිය (සිංහලෙන්/දෙමළෙන්)

1.3 මුලකුරුවලින් හැඳින්වෙන නම් (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :..........

1.4 මුලකුරුවලින් හැඳින්වෙන නම් (සිංහලෙන්/දෙමළෙන්) :..........

02. 2.1 ස්ථිර ලිපිනය : (සිංහලෙන්/දෙමළෙන්) :..........

2.2 ප්‍රවේශපත්‍ර එවිය යුතු ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්) :..........

..........

2.3 ප්‍රවේශපත්‍ර එවිය යුතු ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :..........

2.4 දැනට රාජ්‍ය සේවයේ නියුතු අයෙකු නම් කාර්යාලයීය ලිපිනය :..........

..........

2.5 දුරකතන අංකය :..........

03. 3.1 උපන් දිනය :..........

3.2 අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට (2017.11.25) වයස : අවු. :.......... මාස :.......... දින :..........

3.3 ජාතික හැඳුනුම්පත් අංකය :

04. ස්ත්‍රී/පුරුෂ භාවය :..........

05. 5.1 අයදුම්කරු ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :..........

| ඡන්ද හිමි නාම ලේඛනයට අනුව පදිංචිය | 2015 | 2016 | 2017 |
|---|---|---|---|
| මැතිවරණ කොට්ඨාසය | | | |
| ඡන්ද ප්‍රදේශය | | | |
| ඡන්ද කොට්ඨාසය | | | |
| ග්‍රාම නිලධාරි කොට්ඨාස අංකය | | | |
| ගෘහ අංකය | | | |
| නමට ඉදිරියෙන් ඇති පිළිවෙල අංකය | | | |

06. *අධ්‍යාපන සුදුසුකම් :*

6.1 අ.පො.ස (සාමාන්‍ය පෙළ) විභාගය :

වසර :...................................... විභාග අංකය :..................................

| *විෂයය* | *සාමාර්ථය* |
|---|---|
| සිංහල/ දෙමළ/ ඉංග්‍රීසි | |
| ගණිතය | |
| විද්‍යාව | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |

6.2 අ.පො.ස (උසස් පෙළ) විභාගය :

වසර :...................................... විභාග අංකය :..................................

| *විෂයය* | *සාමාර්ථය* |
|---|---|
| | |
| | |
| | |
| | |

07. තාක්ෂණ සුදුසුකම් :-

| *ආයතනය* | *හදරා ඇති පාඨමාලාව* | *කාල සීමාව* | *සාමාර්ථය* | *සහතිකපත් අංකය හා දිනය* |
|---|---|---|---|---|
| | | | | |

08. *වෙනත් සුදුසුකම් :*..........................................................................................................................................

09. *විභාග ගාස්තු ගෙවීම පිළිබඳ තොරතුරු :*

(i) විභාග ගාස්තු ගෙවූ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නම :........................................................
(ii) දිනය :.........................................................................
(iii) කුවිතාන්සි අංකය :..........................................................................

(මුදල් ගෙවා ලබාගත් ලදුපත මෙම තීරුව අසලින් අලවන්න.)

**අයදුම්කරුගේ ප්‍රකාශය**

මෙම අයදුම්පත්‍රයේ මා විසින් සපයා ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කර සිටිමි. මෙහි සඳහන් කරුණු කිසිවක් අසත්‍ය හෝ වැරදි බව අනාවරණය වුවහොත් මා සේවයට බඳවා ගැනීමට නුසුදුස්සකු වන බවත්, පත්වීමක් ලැබීමෙන් පසු ඒ බව අනාවරණය වුවහොත් සේවයෙන් පහකිරීමට යටත් වන බවත් මා දනිමි.

.............................. ..............................................

දිනය. අයදුම්කරුගේ අත්සන.

**අයදුම්කරුගේ අත්සන සහතික කිරීම**

මෙම අයදුම්පත ඉදිරිපත් කරන ........................................................................ මහතා/මහත්මිය/මෙනවිය මම පෞද්ගලිකව හඳුනන බවත්, ඔහු/ඇය අද දින මා ඉදිරිපිටදී ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බවත්, සහතික කරමි.

දිනය :............................... ....................................................

සහතික කරන්නාගේ අත්සන.

සහතික කරන්නාගේ සම්පූර්ණ නම :-.......................................................................................................................

තනතුර :-..........................................................................................................................................

ලිපිනය :-..........................................................................................................................................

10. රාජ්‍ය හෝ පළාත් රාජ්‍ය සේවාවන්හි දැනට සේවයෙහි නියුතු අයදුම්කරුවකු නම් පහත සඳහන් සහතිකය දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් කළ යුතු ය.

මෙම ඉල්ලුම්කරු වන .................................................................................................................. මහතා/මහත්මිය/මෙනවිය මෙම දෙපාර්තමේන්තුවේ/ආයතනයේ ........................................................................................... වශයෙන් සේවය කරයි. පසුගිය වසර 05 තුළ ඔහු/ඇය මොනම ආකාරයක හෝ විනයානුකූල දඬුවමකට (අවවාද කිරීම් හැර) භාජනය වී නොමැති බව සහ ඉහත තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා මුදා හැරිය හැකි බවත් සහතික කරමි.

...............................................................................

දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ අත්සන.
(නිල මුද්‍රාව සහිතව)

දිනය :.....................................

10-1685

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.